# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1829/24 - 2013 සැප්තැම්බර් මස 23 වැනි සඳුදා - 2013.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ කරන ලද නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන වන මම, මුදල් හා ක්‍රමසම්පාදන විෂය භාර අමාත්‍යවරයා ද විමසා මේ නිවේදනය මගින් -

(1) ඉහත කී පනතේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇති කාමර 400කින් සමන්විත සුඛෝපභෝගී හෝටලයකින්ද සම්මේලන මධ්‍යස්ථානයකින් ද, සූදු සහ ඔට්ටු ඇල්ලීමේ පහසුකම් වලින්ද අලංකාර භෝජන ශාලාද සහ ඒ හා සම්බන්ධ වෙනත් හවුල් ක්‍රියාකාරකම් වලට පහසුකම් ද ඇතුලු සියලු අංගෝපාංගයන්ගෙන් සපිරි විස්තීර්න නිකේතනයක් කොළඹ ඩී. ආර්. විජේවර්ධන මාවතේ ඉදිකර ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතියට අදාළ තොරතුරු සඳහන් නිවේදනය 2013 ජූලි මස 18 වන දින අංක 1819/29 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පලකරන ලද බවත් ;

(2) කාමර 400කින් සමන්විත සුඛෝපභෝගී හෝටලයකින්ද සම්මේලන මධ්‍යස්ථානයකින් ද, සූදු සහ ඔට්ටු ඇල්ලීමේ පහසුකම් වලින්ද අලංකාර භෝජන ශාලාද සහ ඒ හා සම්බන්ධ වෙනත් හවුල් ක්‍රියාකාරකම් වලට පහසුකම් ද ඇතුලු සියලු අංගෝපාංගයන්ගෙන් සපිරි විස්තීර්න නිකේතනයක් කොළඹ, ඩී. ආර්. විජේවර්ධන මාවතේ ඉදිකර ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතිය, මෙම ව්‍යාපෘතියට පනතේ 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇති බවත් ;

(3) කාමර 400කින් සමන්විත සුඛෝපභෝගී හෝටලයකින්ද සම්මේලන මධ්‍යස්ථානයකින් ද, සූදු සහ ඔට්ටු ඇල්ලීමේ පහසුකම් වලින්ද අලංකාර භෝජන ශාලාද සහ ඒ හා සම්බන්ධ වෙනත් හවුල් ක්‍රියාකාරකම් වලට පහසුකම් ද ඇතුලු සියලු අංගෝපාංගයන්ගෙන් සපිරි විස්තීර්න නිකේතනයක් කොළඹ, ඩී. ආර්. විජේවර්ධන මාවතේ ඉදිකර ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතිය ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය ලෙස හඳුන්වනු ලැබිය යුතු අතර සීමසහිත ලේක් ලෙෂර් හෝල්ඩින්ස් සමාගම ව්‍යාපෘති සමාගම වන බවත් ;

(4) කාමර 400කින් සමන්විත සුඛෝපභෝගී හෝටලයකින්ද සම්මේලන මධ්‍යස්ථානයකින් ද, සූදු සහ ඔට්ටු ඇල්ලීමේ පහසුකම් වලින්ද අලංකාර භෝජන ශාලාද සහ ඒ හා සම්බන්ධ වෙනත් හවුල් ක්‍රියාකාරකම් වලට පහසුකම් ද ඇතුලු සියලු අංගෝපාංගයන්ගෙන් සපිරි විස්තීර්න නිකේතනයක් කොළඹ ඩී. ආර්. විජේවර්ධන මාවතේ ඉදිකර ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතිය සඳහා වූ ඉහත කී ව්‍යාපෘතියේ වාණිජමය කටයුතු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සහ ව්‍යාපෘති සමාගම අතර ඇති කර ගන්නා ලද වර්ෂ 2013ක්වූ ජූලි මස 27 වන දින සිට මාස 48ක කාලයක් තුළ ඇරඹිය යුතු බවත් ;

1A - PG 1759 — 550 (2013/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

